මාධ්‍ය නිවේදනය
කොළඹ, 2017 මැයි 25

Nestlé
Good Food, Good Life

# මයිලෝ 'වසරේ විශිෂ්ටතම කණිෂ්ඨ ක්‍රීඩා ප්‍රවර්ධක' සම්මානය දිනාගනී

2016 ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙලේදී රන් සම්මානයෙන් පිදුම් ලබයි

දශක තුනක කාලයක් පුරා මෙරට ලොකු කුඩා සෑම පාසලකම ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් දායකත්වය සපයමින් සිසු දරුවන්ට ශක්තියක් වුණු නෙස්ලේ ලංකා සමාගමේ ජනප්‍රිය පෝෂණීය ශක්ති පානය වන මයිලෝ, පසුගියදා පැවැති 2016 ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙලේදී 'වසරේ විශිෂ්ටතම කණිෂ්ඨ ක්‍රීඩා ප්‍රවර්ධක' සම්මානය දිනාගැනීමට සමත්විය. එහිදී මයිලෝ, රන් සම්මානය දිනාගත් අතර එම කාණ්ඩය යටතේ පිරිනැමුණු ඉහළම සම්මානය ද එය විය.

සිසු දරුවන්ට ක්‍රියාකාරී සහ සෞඛ්‍ය සම්පන්න දිවියක් ගත කිරීම සඳහා අවශ්‍ය පෝෂණය, ශක්තිය, සහාය සහ අවස්ථා ලබාදීම වෙනුවෙන් මයිලෝ විසින් ලබා දුන් ශක්තිමත් හා දීර්ඝ කාලීන කැපවීම මෙම සම්මානය මගින් ඇගැයුමට පාත්‍ර විය. තව ද මයිලෝ මගින් දේශීය ජනතාවට ලබා දෙන ධනාත්මක බලපෑම, නිසි පෝෂණය හා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා උපදේශනාත්මක කාර්යභාරයක් ඉටුකරන සන්නාමයක් ලෙස එය උපයන විශ්වාසය හා ගෞරවය ද, මෙම සම්මානය හරහා පිළිබිඹු වේ.

මෙම ජයග්‍රහණය පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය සභාපති - පානීය නිෂ්පාදන, නෝමන් කන්නන්ගර මහතා මෙසේ පැවසීය. "ක්‍රියාකාරී ජීවන රටාවකට දරුවන්ව සවිබල ගැන්වීම වෙනුවෙන් වසර 30කට ආසන්න කාලයක් පුරා මයිලෝ හදවතින්ම කැපවී සිට ඇත. රට පුරා විසිරී සිටින දක්ෂ ක්‍රීඩකයින්ගේ දිනන ජවය බලගන්වන "Fuelling the winning spirit" තේමාව යටතේ සෑම ළමයෙකුගේම ශාරීරික යෝග්‍යතාව හා යහපැවැත්ම තහවුරු කිරීමට අපි කැපවී සිටිනවා. අපගේ උත්සාහයන් සඳහා මෙම ගෞරවය හිමිවීම පිළිබඳ අප කෘතඥ වනවා මෙන්ම එය අපට විශාල සතුටක්. ඒ වගේම ඉදිරියටත් අනාගත පරපුරේ ඉලක්ක සැබෑ කරගැනීම සඳහා දායකත්වය ලබාදීමට අප කැපවෙනවා".

තරුණ පරපුර තුළ ක්‍රීඩාව පිළිබඳ ඇල්මක් ඇතිකිරීමට මයිලෝ පෙරමුණ ගෙන සිටින්නේ ඔවුන් තුළ සෞඛ්‍යමත් බව, නීරෝගී බව, විනය හා නායකත්වය ගොඩනැගීමටය. පිහිනුම්, ක්‍රිකට්, දැල්පන්දු, මළල ක්‍රීඩා සහ රග්බි වැනි ක්‍රීඩාවන්හි ජාතික තලයේ තරගාවලි සඳහා දායකත්වය සපයමින් සෑම වසරකදීම මිලියන 1.6කට අධික ළමුන් පිරිසකට ශාරීරිකව ක්‍රියාශීලී වීමට අවශ්‍ය පසුබිම සලසා දෙන මයිලෝ, ඒ ඔස්සේ ශ්‍රී ලාංකිකයින් හට නීරෝගීමත් අනාගතයක් ගොඩනැගීමට උර දී තිබේ. එමෙන්ම දක්ෂතා පිරිපුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැසකටම ඔවුන්ගේ වෘත්තිය සඳහා මයිලෝහි සහයෝගය හිමිව ඇත.

පාසල් ක්‍රීඩා දියුණු කිරීමේ මයිලෝ හි ගමන් මග, ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පාසල් ක්‍රීඩා සභා හා සංගම් වැනි නිල බලධාරී ආයතන මෙන්ම ගුරුවරුන්, පුහුණුකරුවන්, දෙමාපියන් හා සිසු දරුවන් යන සියල්ල සමඟ අත්වැල් බැඳගෙන ඉදිරියට යන්නකි. තව

ද තරඟාවලිවලදී නිසි ප්‍රචාරණයක් ඊට හිමිකරදෙමින් හා දක්ෂතා අතරට පිවිසෙන ක්‍රීඩකයින් හා කණ්ඩායම් සමාජයට හඳුන්වා දෙමින් මෙරට මාධ්‍ය මගින්ද ඉහළ සහයෝගයක් ලබා දී ඇත.

ජනාධිපති ක්‍රීඩා සම්මාන උළෙල යනු මෙරට ජාතික ක්‍රීඩා සඳහා වෙන් වූ සුවිශේෂීම සම්මාන ප්‍රදානෝත්සවයි. ඒ හරහා ජාතික තලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම ක්‍රීඩාවේ ප්‍රවර්ධනයට දායකත්වය සැපයූ අනුග්‍රාහකයින්, මාධ්‍ය ආයතන, පුහුණුකරුවන් හා ක්‍රීඩාව හා බැඳුණු ආයතනවලට ද උපරිම පිළිගැනීමක් අත්කරදෙනු ලැබේ.

'වසරේ විශිෂ්ටතම කණිෂ්ඨ ක්‍රීඩා ප්‍රවර්ධක' අංශයේ ජයග්‍රාහකයා තෝරාගැනීමේදී විනිසුරු මඩුල්ල, නිර්ණායක රාශියක් සැලකිල්ලට ගෙන තිබුණි. ජාතික පාසල් ක්‍රීඩා කටයුතු සඳහා ලබාදුන් මූල්‍ය අනුග්‍රහය මෙන්ම එවැනි අනුග්‍රාහකත්වය ලද තරඟාවලි සඳහා සහභාගී වූවන් දැක්වූ දක්ෂතාද එම නිර්ණායක අතර විය.